රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 69

ආයතන මාලා අංක: 51

අංක: 813ඊ 3 ධිර.
1973 ජූලි මස 10 වැනි දින,
කොළඹ 7, නිදහස් චතුරශ්‍රයේ පිහිටි,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දීය.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානයන් වෙතටයි.

රජයේ සේවයේ කම්කරු ශ්‍රේණිවල, ඉංජිනේරු හා කර්මාන්තශාලා
කම්කරු සහ කෘෂිකර්ම හා ක්ෂේත්‍ර කම්කරු වශයෙන් ගෙවීම්
ප්‍රමාණයන් අතර පවත්නා වෙනස අහෝසි කිරීම.

කෘෂිකර්ම සහ ක්ෂේත්‍ර කම්කරුවන්ට ද ඉංජිනේරු සහ කර්මාන්තශාලා කම්කරුවන්ට ද ගෙවනු ලබන වේතන අතර දැනට පවත්නා වෙනස, අනියම් නුපුහුණු (V වන පංතියේ) කම්කරුවන් සම්බන්ධයෙන් හැර අන් සියලුම ස්ථිර, තාවකාලික හා අනියම් කම්කරුවන් සම්බන්ධයෙන් අහෝසි කරලීමට රජය විසින් තීරණය කර තිබේ. ඒ අනුව අනියම් නුපුහුණු කම්කරුවන්ට හැර කම්කරු ශ්‍රේණිවල සිටින සියලුම සේවකයන්ට අනුමත ඉංජිනේරු හා කර්මාන්තශාලා වේතන ප්‍රමාණයන් අනුව වේතන ගෙවනු ලැබේ.

2. දැනට පවත්නා ඉංජිනේරු හා කර්මාන්තශාලා වේතන ප්‍රමාණයන් ද කෘෂිකර්ම හා ක්ෂේත්‍ර වේතන ප්‍රමාණයන් ද මීට අමුණා ඇති උපලේඛනයෙහි දැක්වේ. අනියම් නුපුහුණු කම්කරුවන්ගේ හැර, දැනට කෘෂිකර්ම සහ ක්ෂේත්‍ර වේතන ප්‍රමාණයන් අනුව ගෙවීම් කරනු ලබන අන් සියලුම කම්කරු ශ්‍රේණිවල කම්කරුවන්ගේ වැටුප්, ඒවාට අනුරූප වන ඉංජිනේරු හා කර්මාන්තශාලා වැටුප් ක්‍රමවලට පරිවර්තනය කළයුතුය. එම පරිවර්තනයන් ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වන වගන්තියට අනුකූලව කළයුතුය. එම පරිවර්තනයන් කළයුත්තේ පියවරට පියවරක් දීමේ පදනම පිට නොවන බව පැහැදිලිවම සිතට ගතයුතු ය.

3. මෙම කරුණ සම්බන්ධ රජයේ තීරණය අදාළ වන්නේ කම්කරු ශ්‍රේණිවල සේවකයන්ගේ වැටුප් ක්‍රම අතර පවතින වෙනස අහෝසි කිරීම සම්බන්ධයෙන් පමණක් බව ද කම්කරු ශ්‍රේණිවලට අයත් සේවකයන් නොවන එහෙත් කම්කරු ශ්‍රේණිවල වැටුප් ක්‍රමවලට සමාන වැටුප් ක්‍රම ඇති වෙනත් සේවක ශ්‍රේණිවල වැටුප් ප්‍රතිශෝධනයක් නොකළ යුතු බව ද මෙහි ලා අවධාරණයෙන් පැවසිය යුතුය.

4. බැහැර ප්‍රදේශවල සේවයෙහි යොදවා සිටින අනියම් නුපුහුණු කම්කරුවන් අතුරෙන් තේ වවන ප්‍රදේශවල දැනට දිනකට රු.4.30 බැගින් ගෙවනු ලබන කම්කරුවන්ටත් පොල් හා රබර් වවන ප්‍රදේශවල දැනට දිනකට රු.4.35 බැගින් ගෙවනු ලබන කම්කරුවන්ටත් දිනකට රු.5/- බැගින් ගෙවිය යුතු යයිද රජය විසින් තීරණය කර තිබේ. කොළඹ මහ නගර සභාවේ සීමා ඇතුළත හා එම සීමාවල සිට සැතපුම් 5 ක අරයක් ඇතුළත සේවයෙහි යෙදී සිටින සියලුම අනියම් නුපුහුණු කම්කරුවන්ට දැනට පවත්නා පරිදි දිනකට රු.6/- බැගින් තවදුරටත් ගෙවනු ලැබේ.

5. ඉහත සඳහන් තීරණ 1973 ජූනි මස 1 වන දින සිට ක්‍රියාත්මක වේ. යම් හිඟ වැටුපක් ගෙවීමට ඇතොත් එදින සිට ගෙවිය හැකිය.

6. මෙම චක්‍රලේඛය භාණ්ඩාගාරයේ ලේකම් ගේ එකඟත්වය ඇතිව නිකුත් කරනු ලැබේ.

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා [illegible]

73. .31 වැනි දින පැවති

**කම්කරු ශ්‍රේණියේ සේවකයින්ගේ වැටුප් පරිමාණ.**

| තාවකාලික හා ස්ථිර සේවකයෝ. පන්තිය / ශ්‍රේණිය කලින් ශ්‍රේණිය. | 69.10.1 දිනට පෙර පැවති ගු.හා.ක.ගණයේ අනුරූප මූලික වැටුප් පරිමාණය. | 69.10.1 දිනට පෙර පැවති කා.හා.කෝ.ගණයේ අනුරූප මූලික වැටුප් පරිමාණය. | ගු.හා.ක.ගණයේ ඒකාබද්ධ වැටුප් පරිමාණය. | කා.හා.කෝ.ගණයේ ඒකාබද්ධ වැටුප් පරිමාණය. |
|---|---|---|---|---|
| | වර්ෂයකට රු. | වර්ෂයකට රු. | වර්ෂයකට රු. | වර්ෂයකට රු. |
| සුළු පරිපාලක 1 වැනි ශ්‍රේණිය | 1320-72x12-2184 | 1044-42x8-1380 | 3450-90x12-4530 | 3060-60x9-3600 |
| සුළු පරිපාලක 11 වැනි ශ්‍රේණිය | 960-72x11-1752 | 750-42x8-1086 | 3000-90x11-3990 | 2640-60x10-3240 |
| ජ්‍යෙෂ්ඨ ශ්‍රේණිය | 1320-72x12-2184 | 1044-42x8-1380 | 3450-90x12-4530 | 3060-60x9-3600 |
| 1 වැනි පන්තිය පුහුණු 1 වැනි ශ්‍රේණිය. | 1170-42x14-1674 | 1044-42x8-1380 | 3240-60x12-3960 | 3060-60x9-3600 |
| 11 වැනි පන්තිය පුහුණු 11 වැනි ශ්‍රේණිය. | 750-42x13-1296 | 750-42x8-1086 | 2640-60x15-3540 | 2640-60x10-3240 |
| 111 වැනි පන්තිය අර්ධ පුහුණු 1 වැනි ශ්‍රේණිය. | 540-30x9-810 | 504-30x8-744 | 2208-54x9-2694 | 2154-54x8-2586 |
| 1v වැනි පන්තිය අර්ධ පුහුණු 11 වැනි ශ්‍රේණිය. | 504-30x8-744 | 504-30x8-744 | 2154-54x8-2586 | 2154-54x8-2586 |
| V වැනි පන්තිය නුපුහුණු | 480-30x5-630 | 480-30x5-630 | 2100-54x5-2370 | 2100-54x5-2370 |
| **අනියම් සේවකයෝ.** | | | | |
| සුළු පරිපාලක 1 වැනි ශ්‍රේණිය | දිනකට රු. 4.40 | දිනකට රු. 3.30 | දිනකට රු. 11.40 | දිනකට රු. 9.70 |
| සුළු පරිපාලක 11 වැනි ශ්‍රේණිය | " 3.20 | " 2.10 | " 9.50 | " 7.60 |
| ජ්‍යෙෂ්ඨ ශ්‍රේණිය | " 4.40 | " 3.30 | " 11.40 | " 9.70 |
| 1 වැනි පන්තිය පුහුණු 1 වැනි ශ්‍රේණිය | " 3.86 | " 3.30 | " 10.70 | " 9.70 |
| 11 වැනි පන්තිය පුහුණු 11 වැනි ශ්‍රේණිය | " 2.30 | " 2.10 | " 8.00 | " 7.60 |
| 111 වැනි පන්තිය අර්ධ පුහුණු 1 වැනි ශ්‍රේණිය | " 1.80 | " 1.60 | " 7.00 | " 6.50 |
| 1v වැනි පන්තිය අර්ධ පුහුණු 11 වැනි ශ්‍රේණිය. | " 1.64 | " 1.60 | " 6.60 | " 6.50 |
| V වැනි පන්තිය නුපුහුණු * | | | | |

* කොළඹ හා කොළඹ නාගරික සීමාවෙන් සැතපුම් 5 ක අර්ධ විෂ්කම්භයක් ඇතුළත අනියම් නුපුහුණු කම්කරුවෝ දිනකට රු.6/- බැගින් ගෙවනු ලබති. පිට ප්‍රදේශවල වැඩ කරන කම්කරුවෝ පොල් හා රබර් වවන ප්‍රදේශවල දිනකට රු.4.35 බැගින් ද තේ වවන ප්‍රදේශවල